# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,143 — 1960 ජුනි 10 වැනි සිකුරාද — 10.6.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් ශාඛාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... — — | — | තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 411 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 412 | රට හීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 420 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බංගිරාදිය විකිණීම — ... | 421 | විවිධ දැන්වීම් — — ... | — |


## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලා—1960–61 අභ්‍යාස පංක්ති

පහත සඳහන් ලැයිස්තුවෙහි දක්වෙන සෑම කෘෂිකර්ම ප්‍රායෝගික පාඨශාලාවකම 1960–61 අභ්‍යාස පංක්ති 1960 සැප්තැම්බර් මස 15 වැනි දින ආරම්භ කෙරේ. එක් එක් පාඨශාලාව ඉදිරියෙන් නම් සඳහන් නිලධාරීන් විසින් 1960 ජූලි මස 15 වැනි ද දක්වා ඇතුළත්වීමේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

අයදුම්කරුවන් පහත දක්වෙන සුදුසුකම් ඇත්තවුන් විය යුතුය :—

(1) 1960 සැප්තැම්බර් මස 15 වැනි දින වන විට ඔවුන්ගේ වයස අවුරුදු 16 ටත් 22 ටත් අතර විය යුතු ය.

(2) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතු ය. (පුරප්පාඩු තිබේ නම් පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් අයවළුන්ද තෝරාගනු ලැබේ. එබැවින් පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් වූවන්ටද ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ හැකි ය. එහෙත් එවැනි අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වූවන් තෝරා ගැනීමෙන් පසුව තවදුරටත් පුරප්පාඩු තිබුණහොත් පමණකි).

වැඩි විස්තර පහත දක්වෙන ලැයිස්තුවෙහි සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න :—

| පාඨශාලාව පිහිටි ස්ථානය | දිස්ත්‍රික්කුව | ඉගැන්වීමේ මාධ්‍යය | ඉල්ලුම් පත්‍ර යැවිය යුතු නිලධාරි |
|---|---|---|---|
| **පිරිමි පාඨශාලා :** | | | |
| 1. මාපලාන ... | ... මාතර හා හම්බන්තොට ... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, මාතර |
| 2. ලබුදූව ... | ... ගාල්ල ... ... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, ගාල්ල |
| 3. හොරණ ... | ... කලුතර ... ... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, කලුතර |
| 4. වාගොල්ල | ... කෑගල්ල හා රත්නපුරය ... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, කෑගල්ල |
| 5. අඹේපුස්ස | ... කොළඹ ... ... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, කොළඹ |
| 6. බිබිල ... | ... බදුල්ල ... ... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, බණ්ඩාරවෙල |
| 7. පැල්වැහැර | ... මහනුවර, මාතලේ හා නුවරඑළිය | සිංහල ... | කෘෂිකර්ම නිෂ්පාදන නිලධාරි, මහඉලුප්පල්ලම |
| 8. වාරියපොළ | ... කුරුණෑගල හා හලාවත–පුත්තලම | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, වාරියපොල |
| 9. මහඉලුප්පල්ලම | ... අනුරාධපුර හා පොළොන්නරුව... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, අනුරාධපුර |
| 10. අනුරාධපුරය | ... අනුරාධපුර හා පොළොන්නරුව... | සිංහල ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, අනුරාධපුර |
| 11. කිලිනොච්චිය | ... යාපනය ... ... | දෙමළ ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, යාපනය |
| 12. වව්නියා ... | ... වව්නියා හා මන්නාරම ... | දෙමළ ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, වව්නියා |
| 13. කරදියන්ආරු | ... මඩකලපුව හා ත්‍රිකුණාමළය ... | දෙමළ ... | දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, මඩකලපුව |

411—ජේ. ඇන්. බී 24476—7,113 (5/60)

| පාඨශාලාව පිහිටි ස්ථානය | දිස්ත්‍රික්කුව | ඉගැන්වීමේ මාධ්‍යය | ඉල්ලුම් පත්‍ර යැවිය යුතු නිලධාරි |
|---|---|---|---|
| **ගැහැණු පාඨශාලා :** | | | |
| 1. ලබුදූව ... | ... ගාල්ල, මාතර හා හම්බන්තොට... | සිංහල | ... දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, ගාල්ල |
| 2. වල්පිට ... | ... කොළඹ, කෑගල්ල, රත්නපුර, මහනුවර, මාතලේ, කුරුණෑගල, හලාවත, පුත්තලම | සිංහල | ... දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, කොළඹ |
| 3. බණ්ඩාරවෙල | ... බදුල්ල, නුවරඑළිය ... | සිංහල | ... දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, බණ්ඩාරවෙල |
| 4. තින්නවලි | ... යාපනය, මන්නාරම, වව්නියා, මඩකලපුව හා ත්‍රිකුණාමළය | දෙමළ | ... දිස්ත්‍රික්කු කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, යාපනය |

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960.5.23 ද,
පේරාදෙණිය.

---

අංකය : 1/3/5(ජී) .11 වෙළුම.

## මධ්‍ය ලිපිකාර විභාගය—1958වේ පෙබරවාරි

වර්ෂ 1958වේ ඔක්තෝබර් මස 24 වැනි දින අංකය 11,564, 1958වේ නොවැම්බර් මස 14 වැනි දින අංකය 11,584, 1959යේ පෙබරවාරි මස 6 වැනි දින අංකය 11,659, 1959යේ පෙබරවාරි මස 20 වැනි දින අංකය 11,670, 1959යේ මාර්තු මස 20 වැනි දින අංකය 11,705, 1959යේ මැයි මස 29 වැනි දින අංකය 11,752, 1959යේ ජූලි මස 10 වැනි දින අංකය 11,805, 1959යේ සැප්තැම්බර් මස 18 වැනි දින අංකය 11,856, 1959යේ නොවැම්බර් මස 20 වැනි දින අංකය 11,959, 1959යේ දෙසැම්බර් මස 18වැනි දින අංකය 12,010, 1960වේ ජනවාරි මස 1 වැනි දින අංකය 12,027, 1960වේ ජනවාරි මස 29 වැනි දින අංකය 12,047, 1960 පෙබරවාරි මස 26 වැනි දින අංකය 12,068 සහ 1960 අප්‍රේල් මස 29 වැනි දින අංකය 12,119 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පිළිවෙළින් පළ කරන ලද 1958වේ ඔක්තෝබර් මස 21 වැනි දින, 1958වේ නොවැම්බර් මස 11 වැනි දින, 1959යේ ජනවාරි මස 30 වැනි දින, 1959යේ පෙබරවාරි මස 17 වැනි දින, 1959යේ මාර්තු මස 17 වැනි දින, 1959යේ මැයි මස 26 වැනි දින, 1959යේ ජූලි මස 6 වැනි දින, 1959යේ සැප්තැම්බර් මස 14 වැනි දින, 1959යේ නොවැම්බර් මස 13 වැනි දින, 1959යේ දෙසැම්බර් මස 12 වැනි දින, 1959යේ දෙසැම්බර් මස 28 වැනි දින, 1960වේ ජනවාරි මස 25 වැනි දින, 1960වේ පෙබරවාරි මස 22 වැනි දින සහ 1960වේ අප්‍රේල් මස 25 වැනි දින දරන නිවේදන හා සම්බන්ධයි.

වර්ෂ 1958වේ පෙබරවාරි මස පවත්වනු ලැබූ මධ්‍ය ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයන් ද සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියට පත්කිරීමට තෝරා ගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | ලිපිනය |
|---|---|---|
| කනගසිංගම්, කේ. | ... | මන්තුවිල්, කොඩිකාමම්. |
| ජයවික්‍රම, එච්. පී. | ... | ගම්සභා කාර්යාලය, බාදුරාගොඩ. |
| පච්ලිස්, පී. වී. | ... | 13, මුලනාගොඩ වත්ත, මාඉටිපේ, ගාල්ල. |
| පෙරේරා, කේ. බී. | ... | 34, මීගමු පාර, වත්තල. |
| විලී, එම්. ටී. එම්. | ... | ශ්‍රී විජය සෞගත විද්‍යාලය, වලාන, පානදුර. |
| සිල්වා, එල්. සී. | ... | ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කාර්යාලය, නාත්තන්ඩිය. |
| සුන්දරලිංගම්, වී. | ... | රාජකීය ලංකා ගුවන් හමුදාව, කටුනායක. |
| සුමනදාස, එච්. ජී. | ... | 156, උඩුවෙල පාර, අම්පිටිය, මහනුවර. |

2. මේ අපේක්ෂකයන්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව භාර නොගනියි. නමුත් ඇබෑර්තු ඇති වන විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. සියළුම පත්වීම් තුන් අවුරුදු කාලයක ආධුනික තත්ත්වයේ වන අතර, වෛද්‍ය පරීක්ෂණයකට සහ සාමාන්‍ය ලිපිකරු සේවයේ කොන්දේසිවලට යටත් වෙනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960වේ ජූනි මස 1 වෙනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1) මෘදු වානේ පහඹු සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 6 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 5 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර පෝරම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර කරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර පෝරම සකස් කර තිබේ. රු. 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝරම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර පෝරම කොල ද යි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ජූනි 10 වැනිදා,
කොළඹ දී ය.

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), බිත්ති ඔරලෝසු සැපයීම සඳහා 1960 ජූලි 26 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 ජූලි 25 වැනි සඳුද දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූනි 10 වැනි දින,
කොළඹදීය.

## ආණ්ඩුවේ බඩුගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ.පෙ. 500, කොළඹ 1) 1960 ඔක්තෝබර් 1 වැනි දින පටන් 1961 සැප්තැම්බර් 30 වැනි දින තෙක් පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|
| 1. කපු පුළුන් සැපයීම ... | 1960. 7.5 දා |
| 2. ඉවත ලන කඩදාසි මිලයට ගැනීම | 1960. 7.5 දා |
| 3. කැට් කළ ගල්තාර සැපයීම | 1960.7.12 දා |
| 4. මෙරට සෑදූ ගඩොල් සැපයීම | 1960.7.12 දා |
| 5. මෙරට සෑදූ විෂබීජ නාශක ද්‍රව සැපයීම | 1960.7.12 දා |
| 6. මෙරට සෑදූ තීන්ත සැපයීම | 1960.7.19 දා |
| 7. මෙරට සෑදූ මුද්‍රා ලාකඩ සැපයීම | 1960.7.19 දා |
| 8. මෙරට සෑදූ සබන් සැපයීම | 1960.7.19 දා |
| 9. මෙරට සෑදූ සහ පිට රටින් ගෙන්වන ලද උළු සැපයීම ... | 1960.7.19 දා |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වෙලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, පාර්සන්ස් පාරේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරිතැන ගෙන් පෝර්ම ඉකොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතු යි.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

තීන්ත, මුද්‍රා ලාකඩ, සබන් සහ උළු සැපයීම සම්බන්ධයෙන්, ඒ ඒ ටෙන්ඩර් කරුවන් විසින් කොළඹ 7, බුලර්ස් පාරේ, අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් සවකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතු ය.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූනි 10 වැනි දින,
කොළඹ දී ය.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ඩී. එල්. එෆ්. ටෙන්ඩර් දැන්වීමයි

තැපැල්, රජයේ වැඩ සහ විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූලි 27 වැනි දින පෙරවරු 9.30 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. එදිනම පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන බැවින් අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංක |
|---|---|
| (1) අත් ආයුධ කට්ටල ඇතුළු කරුණු 16ක් — | ඩී. එල්. එෆ්. 47 |
| (2) කේබල් කම්බි කඹ කපනයන් ඇතුළු කරුණු 12ක් — | ඩී. එල්. එෆ්. 48 |

කොළඹ පාර්සන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ජූනි 3 වැනි දින,
කොළඹ 2.

## රාජකීය ලංකා ගුවන් හමුදාව

ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරියා විසින් කොළඹ, පාසත් පාරේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන කාර්යාලයේදී, මෙහි පහත සඳහන් විස්තර පරිදි, කටුනායක රාජකීය ලංකා ගුවන් හමුදා ස්ථානයේ තිබෙන වඩු යන්ත්‍ර දෙකක් උදෙසා ධූලි උද්ධරණ යන්ත්‍රාගාරයක් (Dust Extraction Unit) සැපයීම සහ පිහිටු වීම සඳහා 1960 ජූනි 24 වෙනි දින පෙරවරු 9.30 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ.

(i) ආවෘත්තිය ධූලි සංග්‍රාහකයක් (Cyclone dust collector) සහිත වෝල්ට් 400, සන්ධි 3, ආවර්ත 50 කට සුදුසු දුම් පිටකරන හුලං පෙති යන්ත්‍රාගාරයක් (Motorised exhaust Fan Unit) සැපයීම;

(ii) අවශ්‍ය දුම් නළ සහ දුම් නළ වැසුම් ද වඩු යන්ත්‍ර දෙකට යෝග්‍ය වූ ආධාරක පටි ද ඇතුළුව දුම් පිට කරන හුලං පෙති යන්ත්‍රාගාරය සහ ආවෘත්තිය ධූලි සංග්‍රාහකය ඉසිලීමට උවමනා ආධාරක වානේ නිර්මාණයක් සැපයීම;

(iii) වඩු යන්ත්‍ර දෙකට ධූලි උද්ධරණ යන්ත්‍රයක් වන සේ එම භූමි භාගයේ හුලං පෙති යන්ත්‍රයක් ද ආවෘත්තිය නළ සහ වානේ නිර්මාණය පිහිටුවීම;

2. කොළඹ පාසත් පාරේ ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. කවර ටෙන්ඩර් ආකෘති පත්‍රයක් හෝ නිකුත් කිරීමට ප්‍රථමයෙන් සිවිල් පාලක නිලධාරි සහ ගණකාධිකාරි වෙත රු. 50ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම බලා ගැනීම සඳහා 1960 ජූනි 24වෙනි දින පෙරවරු 9.30 ගුවන් හමුදා ප්‍රධාන කාර්යාලයට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැකිය.

ජේ. ඇල්. බාකර්,
ගුවන් උප-මාර්ෂල්,
ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියා.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු දිශාව භාර වාරිමාර්ග ඉන්ජිනේරුතුමා විසින් පෙරිය පන්ඩි විරිච්චම් වැවේ වම් ඇලේ සොරොව්ව වැඩිදියුණු කිරීම සඳහා 21. 6. 60 වන දින පෙරවරු 9.30 වනතෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

වී. ඇස්. වේලුපිල්ලේ,
සබ්ඩිවිෂන් ඔපිසර්.

මඩුයුනිට්.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බතලගොඩ ගොවිපලේ පොල් විකිණීම

කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන විසින් බතලගොඩ ආණ්ඩුවේ ගොවිපළෙහි ඇති පොල් 40,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 ජූනි මස 30 වෙනි දින පස්වරු 2.30 වනතුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිතැන, කෘෂිකර්ම කාර්යාලය, මල්ලවපිටිය, කුරුණෑගල" යන්න එහි පිට මුදුනේ ලියා එහි මුදුනේ වම් කොනෙහි "බතලගොඩ ආණ්ඩුවේ ගොවිපොළේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "බතලගොඩ ආණ්ඩුවේ ගොවිපළෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණ හොත් ඔහු කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට

කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කරගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු ආඥාපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂකතැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිළ ගණන යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල් වලට ගෙවා ඉවත්කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කරගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ ආණ්ඩුවේ ගොවිපළ භාර කළමනාකාරතැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩ බලන කෘෂිකම් අධ්‍යක්ෂ.

1960 මැයි මස 27 වෙනි දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### වාරියපොල කෘෂිකම් ප්‍රායෝගික පාඨශාලාවට කාර්මික වැඩ පොලක් තැනීම සඳහා ගොඩනැගිල්ලක්

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන, විසින් වාරියපොල පිහිටි ප්‍රායෝගික කෘෂිකම් පාඨශාලාවේ කාර්මික වැඩපොලක් තැනීම සඳහා ගොඩනැගිල්ලක් තැනීමට ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි මස 1 වෙනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකම් ව්‍යාප්තිය නිලධාරි තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර්පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර්පත්‍ර අනුපිටපතක්ද සහිතව ලියුම් කවරයක දමා, සීල් තබා, ඒ කවරයේ "සභාපතිතුමා, කෘෂිකම් අංශයේ ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකම් දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ "වාරියපොල කෘෂිකම් ප්‍රායෝගික පාඨශාලාවට කාර්මික වැඩපොලක් සෑදීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර්පත්‍ර රිජිස්ටර් තැපැලෙන් එවියයුතුයි. රිජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර්පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ, ටෙන්ඩර්පත්‍ර භාරගැනීමට බලයදී තිබෙන නිලධාරිතැනවූ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකම් අංශයේ පරිපාලන නිලධාරි තැනට භාරදියයුතුයි. එම ටෙන්ඩර්පත්‍ර බහාලන කවරයෙහි "වාරියපොල කෘෂිකම් ප්‍රායෝගික පාඨශාලාවට කාර්මික වැඩපොලක් සෑදීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළයුතුයි.

4. රිජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරණ දිනයේ දීම සියළුම ටෙන්ඩර්කරුවන් වෙත දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර්පත්‍ර විවෘතකිරීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත නොලැබුනේ නම් ඒ ගැන පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනගෙන් වහාම විමසියයුතුයි.

5. මෙම ගොඩනැගිල්ල සඳහා රුපියල් 8,000කට වඩා ආණ්ඩුවේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් 1960. 6. 17 වැනි දින දවල් 12 වනතෙක් (සතියේ දිනවල පස්වරු 4 දක්වාද, සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වාද) එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 50ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් ෆෝරම දෙනු ලැබේ. මෙම තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ හෝ කළහැක. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දුපත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් ද කරණු ලැබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර්පත්‍රයක්, නියම ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයක් (Rates) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කල යුතුවාක් මෙන්ම, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තමන්ගේ ලිපිනය ඉතා පැහැදිලි අකුරෙන් ලියා එවිය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන්, කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකම් ව්‍යාප්තිය නිලධාරිතැනගෙන් මෙම ගොඩනැගිල්ලේ ප්ලෑන්, එහි දිග පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබා ගතයුතුයි. සෑම ටෙන්ඩර්කරුවෙක්ම මේ ගොඩනැගිල්ල සෑදීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර්පත්‍ර යැවීම යෙහෙකි.

9. ටෙන්ඩර්පත්‍රයෙහි සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද වැඩෙහි මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දුපත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියමකරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිම වී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත්කරුවාගෙන් යම්කිසි මුදලක් අය කරගැනීමට නොතිබුණොත් පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්තුකරුවන්ගේ ලැයිස්තුවටද ඇතුළත් කරණු ලැබේ.

10. පොරොන්දු පත්‍රයට ඇලවියයුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවියයුතුයි.

11. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට සති හයක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර්පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමටද, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැණීමටද බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

13. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැණීමට පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියමකරනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකරවා ගැණීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් වූ තනැත්තෙක්ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934 රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වෙනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම ගොඩනැගිල්ල සෑදීමට තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යෑමට වුවමනාකරණ නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට

පොරොන්දුවියයුතු අතර, එය පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරණ අතර ඔහුගේ වැඩ තහනම්කරණු ලැබේ. තවද, යම්කිසි අවස්ථාවක වැලැක්විය නොහැකි කරුණු කරණකොටගෙන මෙයින් වැලකීමට බලය කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තුමාගෙන් ලියවිල්ලකින් ලබාගතයුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ මාර්ගයෙන් ලබගතයුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදීම කොන්ත්‍රාත්තුව පැහැරහැරියාකොට සලකනු ලැබේ. තවද කොන්ත්‍රාත්කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විසින් බලය දෙන ලද නිලධාරියෙකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට අවසරදිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුට භාරදියයුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට භාර දුන්නොත්, නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුව හොත් එසේත් නැතහොත් ඔහු ලියාදී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නොත් ඔහුට භාරදුන්නා කොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විසින් සේවයට නුසුදුසුයයි නිගමනය කරණලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනෙකු සොයාගෙන ඔහුගේ වියදමෙන්ම පොරොන්දු පත්‍රයට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විසින් අනුමතකළ යුතුයි.

19. වැඩපැහැරහැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙණෙකුගේ නමත් සමග නම ඇතුළුවූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමක් නිසා කොන්ත්‍රාත්තුව නතරකිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂතැන වෙත තබාගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්තිය නිලධාරිතැනගෙන් ලබාගතයුතුයි.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 ක්වූ මැයි මස 27 වැනි දින,
පේරාදෙණියේදීය.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ එඩින්බරෝ චන්ද්‍රවංකයෙහි 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කළුතර දිස්ත්‍රික්කයේ කළුතර පිහිටි නියමිත මිල යෝජනා ක්‍රමයේ ගබඩාවට 1960 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීමට හා මහගම පිහිටි නියමිත මිල යෝජනා ක්‍රමයේ ගබඩාවට කම්කරු සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960 ජූලි මස 1 වෙනි සිකුරාදා අ. භා. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

2. කළුතර කච්චේරියට රු. 50ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් එහි නියෝජ්‍ය ආහාර පාලකතුමාට ඉදිරිපත්කර 1960 ජූලි මස 1 වෙනි සිකුරාද දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුය.

3. වැඩි විස්තර කළුතර නියෝජ්‍ය ආහාර පාලක තුමාගෙන් හෝ කළුතර ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමාගෙන් ලබාගත හැකිය.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙවනුව,
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1960. 6. 1,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව-සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 ජූලි 12 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

1. වාවාකච්චේරි ආරෝග්‍යශාලාවට ජල සම්පාදන ක්‍රමයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 ජූලි 1 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ, රුපියල් 30,000 වඩා වටිනාකමැති ජල සම්පාදන කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැන්කුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිළධාරීතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7.
දිනය :—1.6.60

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 ජූලි මස 5 වැනි කුජද උදේ 10 වන තෙක් භාරගනු ලැබේ.

1. මදහපොල මාතෘ නිවාසයට ජල සම්පාදන ක්‍රමයක් තැනීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 ජූලි 1 වැනි සිකුරාද සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 5,000ට වඩා වටිනාකමැති ජල කර්මාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ

වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේ දී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම තිබෙන නිලධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් වලංගු ලෙස සලකණු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකු ටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරිංටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434.
කොළඹ 7.
දිනය :—3. 6. 60.

---

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### ජලකර වායුව පිළියෙල කිරීමට වුවමනා ඇලුමිනියම් කෑබලි සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට හොණ්ඩර 40 ක් පමණ ඇලුමිනියම් (කෑබලි වශයෙන්) වුවමනා කර තිබේ. (එසේ වුවමනා කරන්නේ ලියන පට්ටලයෙන් කැපී යන කෑබලි, යම් යම් වැඩට ඇලුමිනියම් පාවිච්චි කිරීමේ දී ඉතිරිවන කෑබලි, තුනී කොළ ආදී වශයෙනි.) මෙම කෑබලි සාමාන්‍ය බෙලෙක් වැඩ කරුවෙකුගේ කතුරෙන් කැපිය හැකි තුනී ඒවා විය යුතුයි. තුනී කොළ වශයෙන් සපයන්නේ නම් කඩදාසි ආදී අපිරිසිදු දේ ඉවත් කොට සැපයිය යුතුයි.

මෙය සැපයිය යුත්තේ 1960 අගෝස්තු මාසයේ දී ය.

